# ගිණුම්කරණය

## 12 ශ්‍රේණිය

### 2.3 ආදායම් ප්‍රකාශනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම



Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

# නිපුණතා මට්ටම 2.3 - ගිණුම්කරණ සමීකරණය ඇසුරෙන් ආදායම් ප්‍රකාශනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරයි.

## ආදායම් ප්‍රකාශය හා මූල්‍ය තත්ව ප්‍රකාශය පිළියෙල කිරීම

### ආදායම් ප්‍රකාශය

ව්‍යාපාරයක් ගිණුම් කාලපරිච්ඡේදයක් තුළ උපයන ලද ලාභය හෝ අලාභය දැක්වීම සඳහා පිළියෙල කරන ප්‍රකාශයයි.

### *මූල්‍ය තත්ත්ව ප්‍රකාශය*

*ව්‍යාපාරයක යම්කිසි දිනකට* පවත්නා වත්කම් හා ඒ සඳහා සම්පත් යෙදවී ඇති ආකාරය දැක්වීම හෙවත් මූල්‍ය තත්ත්වය දැක්වීම සඳහා පිළියෙල කරන ප්‍රකාශයයි.

**නිදසුන :-**

1992 මාර්තු 01 දින චිත්‍රපාල විසින් ප්‍රචාරණ ආයතනයක් ආරම්භ කරන ලදී. පළමු මාසය තුළ පහත සඳහන් ගනුදෙනු සිදුවිය.

(1). චිත්‍රපාල සිය පෞද්ගලික අරමුදල් වලින් රු.10,000ක් ව්‍යාපාරය නමින් වූ බැංකු ගිණුමක තැන්පත් කරන ලදී.

(2). රු.6,000ක කාර්යාල උපකරණ ණයට ගන්නා ලදී. ඒවායේ ඵලදායී ජීව කාලය වර්ෂ 5කි.

(3). ප්‍රචාරණ ද්‍රව්‍ය අත්පිට ගැනුම් රු.1,500 යි.

(4). මාර්තු මාසය සඳහා කාර්යාල කුලී ගෙවීම් රු.600 යි.

(5). සපයන ලද සේවාවන් වෙනුවෙන් ලද මුදල් රු.1,500 යි.

(6). සපයන ලද සේවාවන් වෙනුවෙන් ලැබිය යුතු මුදල් රු.7,000 යි.

(7). චිත්‍රපාල සිය පෞද්ගලික ප්‍රයෝජනය වෙනුවෙන් රු.1,000ක මුදල් ආපසු ගන්නා ලදී.

(8). මාර්තු මාසය සඳහා විදුලි බිල රු.450 යි. අදාල ගෙවීම කරන ලද්දේ අප්‍රේල් මාසයේදීය.

(9). මාර්තු මාසයේ අවසානයේ ප්‍රචාරණ ද්‍රව්‍යවල තොග ගණන් ගැනීමක් කළ අතර, පිරිවැය රු.600ක් වූ තොගයක් ඉතිරිව තිබූ බව හෙළිදරව් විය.

(10). විවිධ ආදායම් රු.400ක් ලැබුණි.

අවශ්‍ය වන්නේ;

1. ඉහත සඳහන් ගනුදෙනු පහත සමීකරණය යටතේ දක්වන්න.
   මුදල් + ණයගැති + තොගය + ජංගම නොවන වත්කම් = ණයහිමියෝ + ප්‍රාග්ධනය
2. මාර්තු මාසය සඳහා ආදායම් ප්‍රකාශය
3. මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
4. ලාභ සමීකරණය ඇසුරෙන් ලාභය හෝ අලාභය ගණනය කිරීම.



Copyright © www.e-thaksalawa.moe.gov.lk

**1.**

| | මුදල් + | ණයගැති + | තොගය + | ජංගම නොවන = වත්කම් | ණයහිමියෝ + | ප්‍රාග්ධනය |
|---|---|---|---|---|---|---|
| 1. | +10,000 | | | | | +10,000 |
| 2. | | | | +6,000 | +6,000 | |
| | | | | -100 | | -100 |
| 3. | -1,500 | | +1,500 | | | |
| 4. | -600 | | | | | -600 |
| 5. | +1,500 | | | | | +1,500 |
| 6. | | +7,000 | | | | +7,000 |
| 7. | -1,000 | | | | | -1,000 |
| 8. | | | | | +450 | -450 |
| 9. | | | -900 | | | -900 |
| 10. | +400 | | | | | +400 |
| | **8,800** | **7,000** | **600** | **5,900** | **6,450** | **15,850** |

**2.** චිත්‍රපාලගේ ව්‍යාපාරයේ

**92/03/31 දිනෙන් අවසන් මාසය සඳහා**

**ආදායම් ප්‍රකාශය**

| | | |
|---|---|---|
| සේවා ආදායම් | 1,500<br>7,000 | 8,500 |
| - විකුණුම් පිරිවැය (පාවිච්චි කල තොග) | | (900) |
| දළ ලාභය | | 7,600 |
| විවිධ ආදායම් | | 400 |
| | | 8,000 |
| අඩුකලා වියදම් | | |
| වත්කම් ක්ෂය | 100 | |
| කාර්යාල කුලී | 600 | |
| විදුලි බිල | 450 | (1,150) |
| ශුද්ධ ලාභය | | **6,850** |


Copyright © www.e-thaksalawa.moe.gov.lk

3. චිත්‍රපාලගේ ව්‍යාපාරයේ

92/03/31 දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | | |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | | |
| කාර්යාල උපකරණ | 6,000 | |
| ක්ෂය | (100) | **5,900** |
| ජංගම වත්කම් | | |
| තොගය | 600 | |
| ණයගැති | 7,000 | |
| මුදල් | 8,800 | **16,400** |
| මුළු වත්කම් | | **22,300** |
| ප්‍රාග්ධනය | 10,000 | |
| +ශුද්ධ ලාභය | 6,850 | |
| | 16,850 | |
| - ගැනිලි | (1,000) | **15,850** |
| ජංගම නොවන වගකීම් | | |
| වත්කම් ණය | | **6,000** |
| ජංගම වගකීම් | | |
| උපචිත විදුලි බිල | | **450** |
| හිමිකම් සහ වගකීම් | | **22,300** |

**4. ලාභය/ අලාභය = (අවසන් ශුද්ධ වත්කම් - ආරම්භක ශුද්ධ වත්කම්) - අමතර ප්‍රාග්ධනය + ගැනිලි**

= (15,850 - 10,000) - 0 + 1,000

= 5,850 + 1,000

**= 6,850**


Copyright © www.e-thaksalawa.moe.gov.lk

### අභ්‍යාස 1. උසස් පෙළ 1997 - (ලකුණු 5)

සිරිවර්ධන සේවා සපයන ව්‍යාපාරයක නිරත වී සිටී. 1997 අප්‍රේල් මාසයට අදාල සාරාංශගත ගිණුම්කරණ දත්ත සමීකරණ ස්වරූපයෙන් පහත දන්වා ඇත. අංක 5 යටතේ ඇති ගනුදෙනුව හැර අයිතිකරුගේ හිමිකම වැඩිවීමට හෝ අඩුවීමට අදාළ ගනුදෙනු ශුද්ධ ලාභයට බලපානු ලබයි.

| | මුදල් | + කාර්යාලද්‍රව්‍ය | + ඉඩම් | = | වගකීම් | + අයිතිකරුගේ හිමිකම |
|---|---|---|---|---|---|---|
| ශේෂය | 45,000 | + 7,500 | + 150,000 | = | 37,500 | + 165,000 |
| ගනුදෙනුව 1 | + 90,000 | | | = | | + 90,000 |
| 2 | - 32,500 | | | = | | - 32,500 |
| 3 | - 23,000 | | | = | - 23,000 | |
| 4 | | + 6,000 | | = | + 6,000 | |
| 5 | - 19,500 | | | = | | -19,500 |
| 6 | - 40,000 | | + 40,000 | = | | |
| 7 | | - 6,800 | | = | | - 6,800 |

(i). ඉහත දැක්වෙන එක් එක් ගනුදෙනුව විස්තර කරන්න.

(ii). මාසය සඳහා ශුද්ධ ලාභය ගණනය කර දක්වන්න.

### අභ්‍යාස 2. උසස් පෙළ 2000 - (ලකුණු 5)

2000 ජනවාරි 01 දින කමල් සේවා ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ජනවාරි මාසයට අදාළ ගනුදෙනු ගිණුම්කරණ සමිකරණය ඇසුරෙන් පහත දැක්වේ. ගනුදෙනු අංක 4, 5, 7 පමණක් ශුද්ධ ලාභයට බලපා ඇත.

| | මුදල් | + ණයගැති | + කාර්යාල ලිපි ද්‍රව්‍ය | + ලී බඩු | = | ණයහිමියෝ | + ප්‍රාග්ධනය |
|---|---|---|---|---|---|---|---|
| ගනුදෙනු 1 | + 60,000 | | | | = | | + 60,000 |
| 2 | - 2,000 | | + 3,500 | | = | + 1,500 | |
| 3 | - 16,000 | | | + 16,000 | = | | |
| 4 | + 6,000 | + 5,000 | | | = | | + 11,000 |
| 5 | - 3,500 | | | | = | | -3,500 |
| 6 | - 1,000 | | | | = | - 1,000 | |
| 7 | | | - 1,500 | | = | | - 1,500 |
| 8 | - 5,000 | | | | = | | - 5,000 |

අවශ්‍ය වන්නේ; (i). එක් එක් ගනුදෙනුව වටිනාකම සමඟ විස්තර කරන්න.

(ii). ජනවාරි මාසය සඳහා ශුද්ධ ලාභය ගණනය කරන්න.

(iii). ජනවාරි මාසය අවසානයේ ශුද්ධ වත්කම්වල වැඩිවීම කොපමණද?




Copyright © www.e-thaksalawa.moe.gov.lk

**අභ්‍යාස 3. උසස් පෙළ 2001 - (ලකුණු 3)**

මොහාන්ගේ ව්‍යාපාරයේ සිදුවූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණය ඇසුරින් පහත දක්වා ඇත.

| | අයිතිකරුගේ ප්‍රාග්ධනය | + | වගකීම් | = | වත්කම් |
|---|---|---|---|---|---|
| (i). | වැඩිවීම | | | = | වැඩිවීම (මුදල්) |
| (ii). | අඩුවීම | | වැඩිවීම (ණයහිමියෝ) | = | |
| (iii). | අඩුවීම | | | = | අඩුවීම (මුදල්) |
| (iv). | වැඩිවීම | | | = | වැඩිවීම (ණයගැතියෝ) |
| (v). | අඩුවීම | | | = | අඩුවීම (තොගය) |
| (vi). | අඩුවීම | | | = | අඩුවීම (ස්ථාවර වත්කම්) |

කාලච්ඡේදය තුළදී අයිතිකරු විසින් මුදලින් ප්‍රාග්ධනයට එකතු කිරීමක් හෝ මුදලින් ප්‍රාග්ධනය ආපසු ගැනීමක් සිදු නොවිණි.

අවශ්‍ය වන්නේ සිදුවී ඇතැයි සැළකිය හැකි එක් එක් ව්‍යාපාර ගනුදෙනුව විස්තර කිරීමය.

**අභ්‍යාස 4. උසස් පෙළ 2003 - (ලකුණු 9)**

**(අ)** ගැලපුම් (අනුසීහුම්) සංකල්පයට අනුව;

(i). වියදම යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

(ii). නැවත විකිණීම සඳහා ගන්නා ලද භාණ්ඩ තොග (ගැනුම්) වියදමක් ලෙස හඳුනාගත යුත්තේ කවර කාලපරිච්ඡේදයට අදාළවද?

**(ලකුණු 2)**

**(ආ)** කසුන්ගේ ව්‍යාපාරයේ 2002/03/31 දින ව්‍යාපාරයේ තත්ත්වය පහත දැක්වේ.

**මුළු වත්කම් රු.100,000 මුළු බාහිර වගකීම් රු.20,000 අයිතිකරුගේ හිමිකම රු.80,000**

**ගනුදෙනු :-** (i). භාණ්ඩ තොග ණයට ගැනුම් රු.20,000

(ii). පිරිවැය රු.15,000ක් වූ භාණ්ඩ ණයට විකුණුම් රු.25,000

(iii). සේවකයින්ට ගෙවූ වේතන රු.4,000

(iv). ව්‍යාපාරයේ ගබඩාවෙන් ලබාගෙන පාවිච්චි කරන ලද කාර්යාල ලිපි ද්‍රව්‍ය රු.1,200

(v). අප්‍රේල් මාසය සඳහා ලද විදුලි බිල්පත රු.1,800

(vi). අයිතිකරු ඔහුගේ පෞද්ගලික පරිගණකය සඳහා ලබාගත් බඩුවල පිරිවැය රු.6,000

(vii). ගනුදෙනුකරුවෙකු විසින් පිරිවැය රු.1,500ක් හා විකුණුම් මිල රු.2,000ක භාණ්ඩ ආපසු එව්වා.

(viii). රු.4,000ක ණයගැතියෙකුගෙන් එකතු කරන ලද මුදල රු.3,600. ඉතිරිය බොල්ණය



Copyright © www.e-thaksalawa.moe.gov.lk

අවශ්‍ය වන්නේ;

(1). ඉහත ගනුදෙනු ආරම්භක ශේෂ ඇතුළුව ගෙන සමීකරණය ඇසුරින්

වත්කම් = වගකීම් + අයිතිකරුගේ ප්‍රාග්ධනය + (ආදායම - වියදම)

(2). සමීකරණයේ දක්වා ඇති එකිනෙක තීරු එකතු කරන්න.

(3). කාලච්ඡේදය අවසානයේ අයිතිකරුගේ හිමිකම ගණනය කරන්න. **(ලකුණු 7)**

***********************


Copyright Ⓒ www.e-thaksalawa.moe.gov.lk